## අධිකරණ සේවා කොමිෂන් සභාව

### ශ්‍රී ලංකා අභියාචනාධිකරණයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් තනතුරට බඳවා ගැනීම - 2017

ශ්‍රී ලංකා අභියාචනාධිකරණයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් තනතුරට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීමට අධිකරණ සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත. ඒ අනුව පහත සඳහන් සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත ය.

02. මසකට රු. 47,615 - 10 x 1,335 - 8 x 1,630 - 17 x 2,170 - රු. 110,895 ක වැටුප් පරිමාණයක් මෙම තනතුරට අයත් ය. (ආරම්භක වැටුප් පියවර මෙම වැටුප් පරිමාණයේ SL 1-2016) 12 වන වැටුප් පියවර (රු. 62,595) වේ. 2020.01.01 දක්වා රා.ප.ච. 03/2016 උපලේඛනයේ II හි පරිදි වැටුප් ගෙවනු ලැබේ.)

03. *සුදුසුකම් :*

*(අ)* අවුරුදු 04ක සතුටුදායක අඛණ්ඩ සේවා කාලයක් ඇති ශ්‍රී ලංකා අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ 1 වන ශ්‍රේණියේ රෙජිස්ට්‍රාර්වරයකු නම්, හෝ

*(ආ)* (I) අවුරුදු 05කට නොඅඩු කාලයක් ක්‍රියාකාරී ලෙස වෘත්තියේ යෙදී සිටි නීතිඥවරයකු නම්, සහ

(II) අයදුම්පත් භාර ගන්නා දිනට වයස අවු. 28ට නොඅඩු සහ අවුරුදු 40ට නොවැඩි විය යුතු ය.

*සටහන*

1. අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ නිලධරයන් සඳහා මෙම උපරිම වයස් සීමාව අදාළ නොවේ.

11. යම් අමාත්‍යාංශයක රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක නීතිඥවරයකු වශයෙන් මාණ්ඩලික තනතුරක හෝ නෛතික තත්ත්වයෙන් හෝ පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ නීති විද්‍යාලයක නීතිය පිළිබඳව ගුරුවරයකු වශයෙන් හෝ ශ්‍රී ලංකා අධිකරණ සේවයේ නිලධරයකු වශයෙන් හෝ කම්කරු විනිශ්චයාධිකාරයක හෝ ගම්බද උසාවියක සභාපතිවරයකු වශයෙන් හෝ සේවය කල කාලපරිච්ඡේදය "ක්‍රියාකාරීව වෘත්තියෙහි යෙදී සිටි" කාලපරිච්ඡේදය වශයෙන් සලකනු ලැබේ.

04. සෑම අයදුම්කරුවෙක්ම -

*(අ)* ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.

*(ආ)* විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

05. පහත සඳහන් ලිපි ලේඛන ඉල්ලා සිටි විට ඉදිරිපත් කිරීමට අයදුම්කරුවන්ට හැකි විය යුතු ය.

*(අ)* උප්පැන්න සහතිකය,

*(ආ)* උසස්ම අධ්‍යාපන සහතිකය,

*(ඇ)* වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකය,

*(ඈ)* සිංහලෙන්, දෙමළෙන්, ඉංග්‍රීසියෙන් සමත් වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය.

06. සම්මුඛ පරීක්ෂණයෙන් අනතුරුව තෝරාගන්නා අයදුම්කරුවන් කොළඹ 12, අභියාචනාධිකරණයේ සේවය කල යුතු ය.

07. මෙම තනතුර සඳහා අයදුම් කරන්නන් මෙහි සඳහන් ආදර්ශ ආකෘතිය අනුව අයදුම්පත පිළියෙල කළ යුතු අතර, එය 2017.06.30 වැනි දිනට හෝ එදිනට පෙර "ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය, කොළඹ 12" යන ලිපිනයට ලේඛනගත තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවර් "ශ්‍රී ලංකා අභියාචනාධිකරණයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් තනතුරට බඳවා ගැනීම - 2017" ලෙසට සඳහන් කල යුතු ය. අයදුම්පත්‍ර භාරග න්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් හා නියමිත සුදුසුකම් සපුරා නොමැතිව එවන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08. රජයේ, රාජ්‍ය සංස්ථා සේවයේ නියුක්තව සිටින නිලධරයන්ගේ අයදුම්පත් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කල යුතු ය.

09. 2017.02.23 වැනි දින රජයේ *ගැසට්පත්‍රයේ* පළකරන ලද නිවේදනය අනුව දැනටමත් අයදුම්පත්‍ර එවා ඇති අයදුම්කරුවන් නැවත අයදුම් කිරීම අවශ්‍ය නොවේ.

ප්‍රදීප් ජයතිලක,
මහාධිකරණ විනිසුරු/ වැඩ බලන ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2017 මැයි මස 17 වැනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

### ශ්‍රී ලංකා අභියාචනාධිකරණයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් තනතුර සඳහා බඳවා ගැනීමේ අයදුම්පත්‍රය - 2017

1. (i) මුලකුරු සමග නම (සිංහලෙන්) :————.
මයා/මිය/මෙනවිය
(ii) මුලකුරු සමග නම (ඉංග්‍රීසියෙන්) :————.
2. මුලකුරු වලින් හැඳින්වෙන නම් :————.
(සිංහලෙන්)

3. (i) උපන් දිනය :————.
(ii) 2017.06.30 දිනට වයස : අවු :———. මාස :———.
දින :———.

4. (i) ස්ථිර පදිංචි ලිපිනය :——————.
(ii) එය අයත් දිස්ත්‍රික්කය :——————.

5. ජාතික හැඳුනුම්පත් අංකය :——————.

6. දුරකථන අංක: (i.) නිවස:—————.(ii.) ජංගම:—————.

7. රෙජිස්ට්‍රාර්වරයෙකු ලෙස ඉල්ලුම් කරන්නේ නම්,
(i) රෙජිස්ට්‍රාර් I වන ශ්‍රේණියට පත් වූ දිනය :————————.
(ii) එම තනතුරෙහි ස්ථිර කල දිනය :——————.
(iii) 2017.06.30 දිනට I වන ශ්‍රේණියේ සේවා කාලය :——————.
(iv) සේවා කාලය තුල යම් කිසි විනයානුකූල දඬුවමකට යටත්ව තිබේද? :——————.
(v) එසේ නම් ඒ පිළිබඳව විස්තර :——————.

8. නීතිඥවරයෙකු ලෙස ඉල්ලුම් කරන්නේ නම්,
(i) නීතිඥවරයෙකු ලෙස දිවුරුම්දුන් දිනය :——————.
(ii) දැනට ක්‍රියාකාරී ලෙස වෘත්තීයේ යෙදෙන අධිකරණයන් :——————.
(iii) යම් අමාත්‍යාංශයක, රජයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක, පිළිගත් විශ්ව විද්‍යාලයක, නීති විද්‍යාලයක, ශ්‍රී ලංකා අධිකරණ සේවයේ යෙදී සිටින්නේ නම්,
(i) පත්වීම් දිනය :——————.
(ii) තනතුර හා ශ්‍රේණිය :——————.
(iii) දෙපාර්තමේන්තුව හා වර්තමාන සේවා ස්ථානය :——————.
(iv) තනතුර ස්ථිර කල දිනය :——————.
(v) සේවා කාලය තුල යම් කිසි විනයානුකූල දඬුවමකට යටත්ව තිබේද? :——————.
(vi) එසේ නම් ඒ පිළිබඳව විස්තර :——————.

9. (i) අධිකරණයකින් ඔබ යම් කිසි වරදකට වරදකරු වී තිබේද? :——————.

(ii) එසේනම් ඒ පිළිබඳව තොරතුරු දක්වන්න :—————.

මා විසින් ඉහත දැක්වූ සියළු තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි.

——————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

*අයදුම්කරුගේ අත්සන සහතික කිරීම*
(දැනට රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා අදාල නොවේ.)

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ............................ මහතා/ මහත්මිය/ මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ ඇය මා ඉදිරිපිටදී .................... දින ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

——————,
අත්සන සහතික කරන අයගේ අත්සන.

දිනය :——————.

(අපේක්ෂකයාගේ අත්සන බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති ස්වාමීන් වහන්සේ නමක්/අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තනතුරක් දරන අයෙකු/ රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී/සාමදාන විනිශ්චයකාර වරයෙකු/දිවුරුම් කොමසාරිස් වරයෙකු/නීතිඥවරයෙකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරියෙකු හෝ රු. 47,615 හෝ ඊට වැඩි මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කලයුතුය)

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය :*

මෙම ...................... සේවය කරන ...................... මයා/මිය/මෙනවිය අවුරුදු 04 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති ශ්‍රී ලංකා අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරියෙකු බවද/ශ්‍රී ලංකා අභියාචනාධිකරණයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් තනතුරට ඉල්ලුම් කිරීමට අවශ්‍ය අවුරුදු 05 වෘත්තීය සුදුසුකම් ඇති ඉල්ලුම්පත්‍ර කැඳවන අවසාන දිනට වයස අවු 40ට නොවැඩි නීතිඥවරයෙකු බවද, ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් දැනට දරන තනතුරින් මුදාහරින බවද, ඔහු/ඇය මා ඉදිරිපිටදී අත්සන් කල බවද ඔහුගේ/ඇයගේ ඉල්ලුම් පත්‍රය නිර්දේශ කර මේ සමග ඉදිරිපත් කරමි. (අනවශ්‍ය වචන කපා හරින්න.)

——————.
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

(මුද්‍රාව)

දිනය :——————.